චක්‍රලේඛ අංක : 31/2013

මගේ අංකය : කේ.06/2
බන්ධනාගාර මූලස්ථානය
කොළඹ 09
2013.09.11

සියළුම බන්ධනාගාර අධිකාරීන් සහ
සහකාර බන්ධනාගාර අධිකාරීන් වෙත .

## 2013.09.12 වෙනි දිනට යෙදෙන සිරකරු දිනය වෙනුවෙන් අතිගරු ජනාධිපති තුමා විසින් පිරිනමනු ලබන විශේෂ රාජ්‍ය සමාව

2013.09.12 වෙනි දිනට යෙදෙන සිරකරු සුභසාධක දිනය වෙනුවෙන් අතිගරු ජනාධිපති තුමා විසින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 34 වන වගන්තියේ බලතල ප්‍රකාරව පහත දැක්වෙන පරිදි බන්ධනාගාර දඬුවම් නියම කර ඇති සිරකරුවන් සඳහා පොදු සමාවක් ප්‍රධානය කර ඇත.

01. බන්ධනාගාර ගතව 2013.09.12 දිනට සිර දඬුවම් විඳින සියලුම සිරකරුවන්ට ගෙවන ලද (ගත කරන ලද) වසරකට හා ඉන් කොටසකට සතිය බැගින් (දින 07 ක ) සමාවක් ලබාදීම.
02. දඩමුදල් නොගෙවීම සම්බන්ධයෙන් බන්ධනාගාර ගතව 2013.09.12 වන දිනට සිර දඬුවම් විඳින සිරකරුවන්ගේ ගෙවෙමින් පවතින දඬුවමේ ශේෂය අහෝසි කිරීම.
03. සිරදඬුවම් ගෙවමින් සිටින 2013.09.12 වෙනි දිනට වයස අවුරුදු 70 ඉක්මවූ සිරකරුවන්ගේ ඉදිරියට ගෙවෙමින් පවතින දඬුවමේ ශේෂය අහෝසි කිරීම.

පහත දැක්වෙන අංක (i) සිට (xxx) දක්වා වූ වැරදි (වගන්ති) සඳහා සිරදඬුවම් විඳින සිරකරුවන්ට ඉහත සඳහන් අංක: 01 , 02 සහ 03යටතේ දක්වා ඇති විශේෂ රාජ්‍ය සමා හිමි නොවේ.

| වරද | දණ්ඩනීති සංග්‍රහයේ වගන්ති |
|---|---|
| (i). නීතිවිරෝධී රැස්වීම | 140 සිට 142 සහ 146 |
| (ii). මංකොල්ල | 380,382 සහ 383 |
| (iii). ගෙවල් බිඳීම සහ රාත්‍රී කාලයේ ගෙවල් බිඳීම. | 431,432,440,441 ගෙවල් බිඳීම<br>443 සහ 446 රාත්‍රී ගෙවල් බිඳීම |
| (iv). රාජ්‍ය ද්‍රෝහී ක්‍රියා | 114 - 123 |
| (v). පැහැරගෙන යාම් | 354 - 360 |
| (vi). අසභ්‍ය ප්‍රකාශන ළමුන්ට අදාළ ප්‍රදර්ශනය | 286A |
| (vii). ළමුන්ට හිංසා කිරීම | 308A |

(viii). ණය බැඳුම්කරයකට හෝ දාස භාවයට පත්කිරිම, බලහත්කාරයෙන් හෝ අනිවාර්යෙන් වැඩ ගැනිම, වහල්කමට භාජනය කිරිම සහ යුද්ධයේ යෙදවිම සදහා ළමයින් බඳවා ගැනිම 358 A

(ix). කුට්ටනය 360A

(x). ළමයින්ගෙන් අයතු ලෙස ලිංගික ප්‍රයෝජන ගැනිම 360B

(xi). නැනැත්තන් වෙළදාම් කිරිම 360C

(xii). ළමයෙකු පොළඹවා ගැනිමට ඇවිටිලි කිරිම 360E

(xiii). දූෂණය කිරිම 364

(xiv). ව්‍යාභිචාරය 364A

(xv). අස්වාභාවික (ලිංගික) වැරදි 365

(xvi). පුද්ගලන් අතර දැඩි අශිෂ්ට ක්‍රියා 365A

(xvii). බරපතල ලිංගික අයථා ක්‍රියා 365B

(xviii). අල්ලස් පනත යටතේ වැරදිකරුවන් වුවත්

(xix). 1966 අංක 18 දරණ පිඩාකාරි ආයුධ පනතේ වැරදි

(xx). ගිනි අවි ආඥා පනත යටතේ වැරදි

(xxi). 1979 අංක 48 දරණ ත්‍රස්තවාදය මර්ධන (තාවකාලික) විධි විධාන පනත යටතේ වැරදි

(xxii). 1982 අංක 24 දරණ ගුවන් යානා එරෙහි පනත යටතේ වැරදි

(xxiii). විස, අබිං සහ අන්තරායකර ඖෂධ ආඥා පනත යටතේ වැරදි

(xxiv). හදිසි නිතිය යටතේ වැරදිකරුවන් වුවත්

(xxv). ආදායම් බදු නඩු වල මුදල් ගෙවිම පැහැර හැරිම සම්බන්ධයෙන් සිරදඬුවම් විදින්නවුන්

(xxvi). රේගු ආඥා පනත යටතේ වැරදිකරුවන් වුවත්

(xxvii). ඉහත අංක **i** සිට **xxvi** යටතේ දැක්වෙන වැරදි සම්බන්ධයෙන් යුධහමුදා පනත, නාවික හමුදා පනත හෝ ගුවන් හමුදා පනත යටතේ යුද්ධාධිකරණය විසින් වැරදිකරුවන් කරනු ලැබූ අය.

(xxviii). 2006 අංක 05 දරණ නීති විරෝධි මුදල් රදවාගැනීම වැලැක්වීමේ පනත යටතේ වරදකරුවන් කරනු ලැබූ අය.

(xxix). 2006 අංක 06 දරණ මූල්‍ය ගණුදෙනු වාර්ථාකරණය යටතේ වරදකරුවන් කරනු ලැබූ අය.

(xxx). 2005 අංක 25 දරණ සත්‍යය වසන්කර ත්‍රස්ත වාදයට මූල්‍යාධාර සැපයීමේ පනත යටතේ වැරදිකරුවන් කරනු ලැබූ අය.

ඉහත සදහන් විශේෂ සමාව අදාළ වනුයේ 2013.09.12 වන දින වන විට බන්ධනාගාරගතව සිර දඩුවම් විදිමින් සිටින සිරකරුවන් කෙරෙහි පමණි. මුදා හැරිම ක්‍රියාත්මක කළ යුතු දිනය 2013.09.12 දින වේ.

එක් සිරකරුවෙකුට ඉහත සදහන් විශේෂ රාජ්‍ය සමාවන් හිමිවිය යුත්තේ එක් වරප්‍රසාදයක් පමණි.

මෙම විශේෂ සමාව යටතේ ඔබ ආයතනයෙන් මුදාහරිනු ලබන සිරකරුවන් සංඛ්‍යාව 2013.09.12 වන දින පෙ.ව.8.00 ට පෙර දුරකථන පණිවුඩයක් හෝ ෆැක්ස් පණිවුඩයක් මගින් දැනුම් දී නිදහස් කිරිමෙන් පසු ලිපියක් මගින් විස්තර සහිතව සනාථ කරන්න.

බන්ධනාගාර කොමසාරිස් ජනරාල්